# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2194/52 - 2020 සැප්තැම්බර් මස 23 වැනි බදාදා - 2020.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, නාගරික සංවර්ධන හා නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීම හා ඒ ආශ්‍රිත නාගරික සංවර්ධන කටයුතු සඳහා කඩිනමින් අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 799 සී, බටහිර පුහම්බොගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පුහම්බුගොඩ ගමේ පිහිටි ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එන්. මලිත් එම් ද සිල්වා මහතා විසින් 2018.12.06 දිනැති ව මැන පිළියෙල කරන ලද අංක 3321 දරන පිඹුරෙහි කැබලි අක්ෂර ''ඒ'' දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 7.7270 ක් පමණ වූ තිත්තගස්මුල්ලලන්ද වත්ත නැමති ඉඩමට මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | සී. රණවීර හා තවත් අය හිමිකම් කියනු ලබන ඉඩම් |
| *නැගෙනහිරට* | : | ඇලදූව පාර, කේ. ජී. කුල්මන්සිංඤෝ හා තවත් අය, කේ. ඒ. සෝමපාල හා තවත් අය හිමිකම් කියනු ලබන ඉඩම්, පිඹුරු අංක 473 කැබලි අංක 1න් කොටසක් (එම්. කේ. එන්. කුරේ හිමිකම් කියන ඉඩම) සහ ආර්. හෙන්ද්‍රික් හා තවත් අය හිමිකම් කියනු ලබන ඉඩම් |
| *දකුණට* | : | කේ. ඒ. සෝමපාල හා තවත් අය හිමිකම් කියනු ලබන ඉඩම්, පිඹුරු අංක 473 හි කැබලි අංක 1 න් කොටසක් (එම්. කේ. එන්. කුරේ හිමිකම් කියන ඉඩම) සහ ආර්. හෙන්ද්‍රික් හා තවත් අය හිමිකම් කියනු ලබන ඉඩම් සහ පිඹුරු අංක 473 හි කැබලි අංක 2 |
| *බටහිරට* | : | සී. ඒ. ඩාවිත් සින්ඤෝ හා තවත් අය, කේ. ජේ. රණවීර සහ තවත් අය සහ කේ. ඒ. ජුලිස් සිංඤෝ හා තවත් අය හිමිකම් කියනු ලබන ඉඩම් |

10 - 336

1A - G 32976— 25 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*